# කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

**ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි තෙවන පරීක්ෂණය (බාහිර) - 2022**

**2025 ජූලි**

**මානවශාස්ත්‍ර පීඨය**

## බෞද්ධ සංස්කෘතිය

**(නව නිර්දේශය)**

**බෞද්ධ සංස්කෘතියේ ශ්‍රී ලාංකේය වර්ධනය හා ආසියානු ව්‍යාප්තිය BUCU 38214**

කොටස් දෙකෙන්ම ඇතුළත් වන සේ ප්‍රශ්න **පහකට (05)** පමණක් පිළිතුරු සපයන්න.

**ප්‍රශ්න සංඛ්‍යාව : 10 යි.** **කාලය : පැය 03 යි.**

---

### I කොටස

01. අදාළ මූලාශ්‍රය ඇසුරු කරගනිමින් මහින්දාගමනයේ ඓතිහාසික හා සංවිධානාත්මක පසුබිම විමර්ශනය කරන්න.

02. පැරණි ශ්‍රී ලාංකේය රාජකීයයන්ගේ බෞද්ධාගමික ප්‍රතිපත්ති බෞද්ධ සංස්කෘතිය කෙරෙහි කවර බලපෑමක් ඇතිකරන ලද දැයි සාකච්ඡා කරන්න.

03. කතිකාවත් යනු කුමක්දැයි දක්වා, ශාසනික සුරක්ෂිතතාව පිණිස එමගින් ලැබෙන අනුග්‍රහය පොළොන්නරු කතිකාවත ඇසුරින් විභාග කරන්න.

04. පෘතුගීසීන්ගේ ආගමනය සාම්ප්‍රදායික ශ්‍රී ලාංකේය බෞද්ධ සභ්‍යත්වයේ පැවැත්මට අභියෝගකාරක වූ අයුරු සනිදර්ශනව පහදන්න.

05. ශ්‍රී ලාංකේය භික්ෂූන් වහන්සේගේ ජාතික මෙහෙවර, සමාජ ක්ෂේත්‍රයන්හි ඇතිකළ උන්නතිය කවරේදැයි ඓතිහාසික නයින් විභාග කරන්න.

### II කොටස

06. බුද්ධකාලීන ශාසන ව්‍යාප්තියේ පරිමාණය පුළුල් කිරීමෙහි ලා බුදුසිරිතේ ශ්‍රේෂ්ඨත්වය මෙන්ම බුද්ධධර්මයේ විශිෂ්ටතා ලක්ෂණ එකසේ ඉවහල් වූ අයුරු සකාරණව පැහැදිලි කරන්න.

07. භික්ෂු සමාජය නිකාය වශයෙන් බෙදීයාම පිණිස ඉවහල් වූ විවිධ හේතු සාධක සමාලෝචනය කරන්න.

08. ධර්මාශෝක මහරජතුමාගේ ආගමික කාර්යභාරය බෞද්ධ සංස්කෘතියේ සංවර්ධනය හා ව්‍යාප්තිය කෙරෙහි සාධක වූ අයුරු පෙන්වා දෙන්න.

09. බුරුමය හෝ ථායිලන්තය ලංකාව සමග පවත්වන ලද බෞද්ධාගමික සබඳතා දක්වා, එය ථේරීය බෞද්ධ සම්ප්‍රදායේ චිරපැවැත්ම සඳහා කෙතෙක්දුරට ඉවහල් වී දැයි පහදා දෙන්න.

10. ප්‍රාග් බෞද්ධ චීන ආගමික පසුබිම හඳුන්වා දෙමින්, එරට බෞද්ධ සංස්කෘතියේ ප්‍රභවය පිළිබඳ පවත්නා මතවාද සමාලෝචනය කරන්න.

**************************